# 8 මී නුවණ

එකමත් එක ගෙදරක බොහොම නපුරු පූසෙක් හිටියා. මේ නිසා ඒ ගෙදර හිටපු මීයන් හිටියේ හරි ම බයෙන්. නපුරු පූසා කොහොම හරි මීයන් අල්ලාගෙන කනවා.



දවසක් මී රංචුවේ හිටපු වයසක ම මීයා රැස්වීමක් කැඳෙව්වා. " අපේ රංචුවේ මීයන් දවසින් දවස අඩුවෙනවා. කොහොම හරි පූසා හැමදා ම අපෙන් එක මීයෙකුවත් අල්ලා ගන්නවා."

" ඉතින් අපි මොනවා කරන්න ද? පුංචි මී පැටියෙක් හරි ම දුකෙන් ඇහුවා.

" පූසාගෙන් පරිස්සම් වෙන්න. " මහලු මීයා කරුණාවෙන් උත්තර දුන්නා.

" නිතර ම සෝදිසියෙන් ඉන්න. පූසා ඉන්න බව දැනුනොත් වහා ම ආපසු එන්න. " තවත් මීයෙක් අවවාද කළා.

මේ උපදෙස් මීයෝ පිළිපැද්දා. ඒ නිසා පූසාට දවස් ගාණක් ම මීයන් අල්ලා ගන්න බැරි වුණා. පූසා උපායක් කල්පනා කළා.

දවසක් පූසා කුස්සියේ මේසය ළඟ මැරිලා වගේ බිම දිගාවෙලා හිටියා. පූසාගෙ සද්දයක් නැති බව දැකලා මීයෝ එකා දෙන්න එළියට ආවා. මීයන් හිතුවා පූසා මැරිලා කියලා.

"පූසාගෙ රැවුලෙන් අදින්න" තරුණ මීයෙක් කිව්වා. තවත් තරුණ මීයෙක් පූසා කිට්ටුවට ගියා.

" පූසා ළඟට කවුරුත් යන්න එපා. පූසා මහා භයානක සතෙක් අපි බලමු පූසා මැරිලා ද කියලා " වයසක මීයා කිවුවා.

" අර මේසෙ උඩ තියෙන පිටි මල්ල පූසාගෙ ඇඟට පෙරළන්න. " වයසක මීයා නැවතත් කිවුවා. තරුණ මීයෙක් හෙමිහිට ගිහින් පිටිමල්ල පූසාගෙ ඇඟට පෙරළුවා.



එක පාරට ම පිටිමල්ල ඇඟට වැටුණා ම පූසා බයවෙලා උඩ පැන්නා. උගේ ශරීරය පුරා ම පිටි විසිරුණා. **පූසා පස්ස නොබලා පැනලා දිව්වා.**

මීයෝ පණ බේරාගෙන ගුල්වලට රිංගා ගත්තා.



## ක්‍රියාකාරකම : 1

කතාව ශබ්ද නගා කියවන්න.

## ක්‍රියාකාරකම : 2

කතාවේ චරිත බෙදාගෙන නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 3

කතාවේ කළු කර ඇති වාක්‍ය නිසි හඬ පාලනයෙන් යුතු ව කියවන්න.

## ක්‍රියාකාරකම : 4

පහත දැක්වෙන සිදුවීම් අනුපිළිවෙළින් ගළපා කතාවක් ගොඩනගන්න.

- දවසක් කම්මල්කරුවා ලොකු වැඩක් කරන විට මදුරුවෙක් දෂ්ට කරන්න පටන් ගත්තා.
- "මං මදුරුවාට ගහන්න ද?" ගෝලයා ඇසුවා.
- මදුරුවා කැරකි කැරකී ඉඳලා කම්මල්කරුවාගේ හිස උඩ වැහුවා.
- එක්තරා දක්ෂ කම්මල්කරුවකුට හිතවත් ගෝලයෙක් හිටියා.
- ඔළුව දෙපළු වී කම්මල්කරු මැරී වැටුණා. මදුරුවා ඉගිළී ගියා.
- කොච්චර තළන්න හැදුවත් මදුරුවා ඉගිළිලා යනවා.
- ගෝලයා හරි ම කීකරුයි. කම්මල්කරුවාට හරි ම ආදරෙයි. ඒත් හරි ම මෝඩයි.
- මේක දැකලා ගෝලයාට මදුරුවා එක්ක හරි ම තරහයි.
- ගෝලයා, ළඟ තිබුණු පොරව අරගෙන දෑත බඳලා මදුරුවාට ගැහුවා.
- වැඩ කරන ගමන් ම " හා " කියා කම්මල්කරු කිව්වා.

## ක්‍රියාකාරකම : 5

මෙම කතාව පැහැදිලි ව වචන උච්චාරණය කරමින් හඬ පාලනයෙන් යුතු ව කියන්න.

## ක්‍රියාකාරකම : 6

ඔබ කියවූ කතාවක් තෝරා ගන්න. එක් අයෙකු එක් වාක්‍ය බැගින් ඉදිරිපත් කරමින් අනුපිළිවෙළින් කතාව ගොඩ නගන්න.